**විල්ගමුව ප්‍රාදේශීය සභාව - 2021**
**-----------------------------------**

## **1.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

### **1.1** **අභිතකර මතය**
**----------------**

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### **1.2** **අභිතකර මතය සඳහා පදනම**
**-----------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### **1.4** **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**
**------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු උසාවි දඩ ගාස්තු ලැබිය යුතු උසාවි දඩ ගිණුමේ සටහන් නොකර උසාවි දඩ ආදායම් ගිණුමේ සටහන් කිරීම හේතුවෙන් හිඟහිටි උසාවි දඩ ගිණුම හා වසරේ උසාවි දඩ ආදායම රු.2,071,330 ක් වැඩියෙන් දැක්වේ. | විගණිත කරුණ පිළිගනිමි. 2022 ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශයේ හිමිකම් වල එකතුව රු.150,286,680 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය 155,270,905 ක් ලෙස රු.4,984,225 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණිත කරුණ පිළිගනිමි. 2022 ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අතිරික්තය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය අනුව රු.12,033,417 ක් වුවද එය සමුච්චිත අරමුදලට රු.7,076,983 ක් ලෙසට ගලපා තිබීම නිසා සමුච්චිත අරමුදලේ ශේෂය රු.4,956,434 ක් අඩුවෙන් දැක්වේ. | විගණිත කරුණ පිළිගනිමි. 2022 ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කරන ලද ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2020 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ යුතු එකතු වටිනාකම රු.10,949,297 ක ප්‍රදාන හා සංචිත ගිණුම් වලින් අත්හැරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ හිමිකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණිත කරුණ පිළිගනිමි. 2022 ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.7,432,603 ක් වුවද මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ එය රු.14,308,191 ක් ලෙස රු.6,875,588 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 28 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම සහ අනුරූපි වාර්තා අනුව වටිනාකම අතර රු.14,584,582 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන ගිනුම් සටහන් නිවැරදි කළ යුතුය. |

**1.6.3 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු. 1,501,545 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. | 2007 වර්ෂයේ සිට පැවත එන මෙම අවිනිශ්චිත ශේෂය පිළිබඳ සියලු තොරතුරු පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.110,920,248 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය | සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිනුම් ශේෂයන්ගේ වටිනාකම් තහවුරු කරන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.4,347,452 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,139,387 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඉකුත් වර්ෂය අවසානයට රු.3,540,823 ක මුළු ආදායම් හිඟය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.5,715,345 ක් දක්වා වැඩිවී තිබුණි. | පිලිතුරු ලබාදී නොමැත. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රාජ්‍ය අංශයේ වරිපනම් ඒකක 665 කින් අයවිය යුතු හිඟ රු.143,292 ක් ඇතුළුව රු.480,739 ක හිඟ වරිපනම් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදි මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනතට අනුව වරිපනම් අයකිරීම සඳහා දේපල වසර 05 කට වරක්වත් තක්සේරු | වර්ෂ 02 ක් සඳහා නව තක්සේරුව නතරකර ඇති ගැසට් පත්‍රය අවලංගු | නව තක්සේරුවක් කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතු වුවද එසේ සිදුනොකර 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේද වරිපනම් අයකර තිබුණි. | කළහොත් 2023 නව තක්සේරුව ක්‍රියාත්මක කිරිමට හැකියාව පවතී. | |
| (ඇ) | වසර 12 කට අධික කාලයක සිට අය නොවී පවතින රු.665,316 ක හිඟ කඩ කුලි සමාලෝචිත වර්ෂයේදී ද අයකර නොතිබුණි. | ඉඩමේ අයිතිය නොමැතිවීම නිසා මෙම කඩකුලී අයකර ගැනීමට නොහැකිව පැවතියද එම මුදල් කපාහැරීමට කටයුතු කරයි. | හිඟ කඩකුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වසර 12කට අධික කාලයක් තිස්සේ පොදු වෙළදපල කඩ කාමර 11 හි අයිතිය සභාවට පවරා ගැනිමට කටයුතු නොකිරිම හේතුවෙන් නව තක්සේරුවක් මත බදු දී සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | මෙම කඩ කාමර සභාවට පවරාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලා ඇත්තෙමි. | කඩ කාමර වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - 2018 විශේෂ ආර්ථික යටිතල පහසුකම් නගාසිටුවීමේ වැඩසටහන යටතේ වකුගඩු රෝගීන් වෙසෙන නිවාස 103 ක් සඳහා ලිටර් 500 ජල ටැංකි ලබාදීම සඳහා රු.478,900 ක වියදමක් දරා ජල ටැංකි 103 ක් මිලදී ගෙන තිබුණද එම ජල ටැංකි අදාළ ප්‍රතිලාභීන්ට ලබා දී නොතිබුණි. | පොදු ප්‍රයෝජනය සඳහා අදාළ මන්ත්‍රීවරයාගේ මැදිහත්වීම මත පොදු ස්ථාන වල තැබීම සඳහා ලබාදී ඇත. | ජල ටැංකි අදාළ ප්‍රතිලාභීන්ට ලබා දීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී සිදුකරන ලද මූලික පරීක්ෂණයක් මඟින් ප්‍රාදේශීය සභාවට අයත් ගැල්වනයිස් යකඩ (GI) බට 40 ක ඌණතාවයක් සම්බන්ධයෙන් අදාළ මු.රෙ. 104(4) පරීක්ෂණය මඟින් ඊට සම්බන්ධ නිලධාරීන්ගේ නීත්‍යානුකූලව අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව නිර්දේශ තිබුණද අලාභය අයකරගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන් හා මන්ත්‍රීතුමන්ලා අධිභාර නොගෙවීම නිසා නැවත සිහිකැඳවීම් ලිපි යවා ඇත. | මු. රෙ. 104 අනුව අදාළ ඌනතාවයේ වටිනාකම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු එහෙත් දිර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගනු නොලබන ස්ථාවර වත්කම් රාශියක් සභා භූමියේ පැවතුණි. මෙම ස්ථාවර වත්කම් බොහෝමයක් නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර බොහෝ රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා වර්තමානය වන විට අලුත්වැඩියා කිරිමට අවශ්‍ය අමතර කොටස් වෙළඳපලේ නොපැවතුණි. ඒ අනුව මෙම වත්කම් අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු නිදහස් කිරිමෙන් පසු අපහරණය කිරිමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 770(4)(ආ) අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |